# ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ නාම සංශෝධන සම්බන්ධව

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 09/2021 අංක දරණ චක්‍ර ලේඛය අනුව ශිෂ්‍යයින්ගේ නම් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් වූ ඉල්ලීමේ ලිපි එම සිසුවා අයත් ප්‍රවේශ කණ්ඩායමේ උපාධිය ක්‍රියාත්මක වන දිනට පෙර (before the effective date of the degree) අදාළ ලිපිලේඛන සමග ඉදිරිපත් කල යුතුය. ඒ අනුව, අවසන් වසර අවසාන විභාග දිනයට නැතිනම් පර්යේෂණ නිබන්ධන භාරදීමේ අවසාන දිනයට පසුව නම සංශෝධනය සඳහා ඉදිරිපත්වන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

ඒ අනුව, විශ්වවිද්‍යාල තොරතුරු කළමනාකරණ පද්ධතියෙහි (RUMIS ) ඇති ඔබගේ සම්පූර්ණ නම පරීක්ෂාකර බලා එහි සඳහන් වන ඔබගේ නම සංශෝධනය කළ යුතු වන්නේ නම්, ඔබගේ ඉල්ලීම් ලිපිය සමඟ පහත සඳහන් කර ඇති පරිදි අදාළ අනෙකුත් ලේඛන ශිෂ්‍ය කටයුතු අංශය වෙත උපාධිය ක්‍රියාත්මක වන දිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

| උසස් පෙළ සහතිකයේ නම වැරදි නම් | උප්පැන්න සහතිකය සංශෝධනයකදී | උපැවදි වීමකදී |
|---|---|---|
| ශිෂ්‍යයාගේ ඉල්ලීමේ ලිපිය | ශිෂ්‍යයාගේ ඉල්ලීමේ ලිපිය | ශිෂ්‍යයාගේ ඉල්ලීමේ ලිපිය |
| සංශෝධිත උසස් පෙළ සහතිකයේ මුල් පිටපත | උප්පැන්න සහතිකයේ මුල් පිටපත | උප්පැන්න සහතිකයේ මුල් පිටපත |
| උප්පැන්න සහතිකයේ මුල් පිටපත | පුවත්පත් දැන්වීමේ මුල්පිටපත | උපැවදි සහතිකයේ මුල් පිටපත |
| දිවුරුම් කොමසාරිස්වරයාගේ දිවුරුම් ප්‍රකාශය | දිවුරුම් කොමසාරිස්වරයාගේ දිවුරුම් ප්‍රකාශය | දිවුරුම් කොමසාරිස්වරයාගේ දිවුරුම් ප්‍රකාශය |
| දිවුරුම් කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත | දිවුරුම් කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත | දිවුරුම් කොමසාරිස්වරයා විසින් සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත |

❖ දිවුරුම් කොමසාරිස්වරයා යනු සාම විනිසුරු නොවේ.

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු